# 1.3 බෙංගාලි සිනමාකරු රිත්වික් සටක්ගේ නිර්මාණවල ස්ත්‍රී චරිත නිරූපණය (සරණාගත ස්ත්‍රීන්ගේ භූමිකාව කෙරෙහි විශේෂ අවධානයකින්)

සුජානි සෝමසිරි
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය pnssomasiri@gmail.com

## ABSTRACT

රිත්වික් කුමාර් සටක්, බෙංගාලි සිනමාවේ අතිශය විප්ලවකාරී අධ්‍යක්ෂවරයෙකි. වඩාත් සමාජ දේශපාලන නැඹුරුවක් සහිතව සිනමාකරණයේ නියැලි අධ්‍යක්ෂවරයෙකු ලෙස ඔහු ජාත්‍යන්තර සිනමාවේ ද නොමඳ අවධානයට ලක්ව තිබේ. බෙංගාලය දෙකඩ වීමෙන් සිදු වූ විවිධ සාමාජික, ආර්ථික සහ දේශපාලන තත්ත්වයන් ඔහුගේ සිනමා නිර්මාණවලට තේමා විය. මෙවැනි පීඩාකාරී සමාජ තත්ත්වයන් නිරූපණය කිරීමේ දී සටක්, ස්ත්‍රී චරිත යොදා ගත් ආකාරයෙහි විශේෂත්වයන් පවතී. නොයෙක් විනාශකාරී බලවේග වල සහ නවීකරණයෙහි, නාගරීකරණයෙහි අනිටු ප්‍රතිවිපාක නිරූපණයේ දී සංකේතයක් ලෙසත් සමාජ වටිනාකම් විනාශ වී යාමට එරෙහිව විරෝධය ප්‍රකාශනය සඳහාත් කාන්තා චරිත යොදා ගැනීම විශේෂත්වයකි. සටක්ගේ චිත්‍රපටවල එන කාන්තා චරිත, සමාජ පීඩනයට ලක්වීමෙන් පන්නරය ලැබූ අතිශය ක්‍රියාකාරී,ප්‍රාණවත් චරිත වෙති. ඔවුන් සතු වන මානවවාදී දයාර්ද්‍ර ගුණාංග වනසා දැමීමට එන සියලු බලවේගවලට ඔවුහු අභියෝග කරති. ඇතැම් විටෙක අසම්මත ලෙස කෲරත්වය සමග සටනට එළඹෙති.

පශ්චාත් නිදහස් බෙංගාලය පිළිබඳ වැදගත් දෘෂ්ටියක් සටක්ගේ චිත්‍රපටවල ගැබ් විය. 1947 දී ඉන්දියාවේ බෙදීම හේතුකොට ගෙන බෙංගාලි සමාජයේ ද විවිධ බෙදීම් ඇති විය. ඔහු මේ බෙදීම තම සිනමා නිර්මාණ මගින් ගවේෂණයට ලක් කළේය. **මේඝ ධාක තාරා, සුබර්ණ රේඛා, කෝමල් ගන්ධාර්** කල්කටාව මුල් කරගෙන සරණාගත භාවය පිළිබඳ තැනුණු චිත්‍රපට ත්‍රිත්වයකි. සංක්‍රමණික සරණාගත ස්ත්‍රිය මූලික කොට ගැනීම, ඔහුගේ ස්ත්‍රී චරිත නිරූපණයෙහි සුවිශේෂතාවකි. **මේඝ ධාක තාරා** (1960) චිත්‍රපටයේ දරිද්‍රතාවයෙන් පෙලෙන සරණාගත ජනපදයක වාසය කරන නීතා සිය පවුල රැක ගැනීම උදෙසා ජීවිතය කැප කරයි. **සුබර්ණ රේඛාහි** (1965) බෙංගාලය බෙදා වෙන් කළ පසු කල්කටාවට සංක්‍රමණය වූ සරණාගත පවුලේ සීතා, අසරණත්වය හමුවේ වෙසඟනක් බවට පත් වේ. ඇයට සහෝදරියක, බිරිඳක හෝ මවකගේ භූමිකාව යහපත්ව ගත කිරීමට ඉඩක් නැත. මෙහි එන කතා නායිකාව වන සීතා නියෝජනය කරන්නේ බෙංගාලය දෙකඩ වීමෙන් අක්මුල් උදුරා දැමීමට ගොදුරු වූ සරණාගත භාවයයි. **කෝමල් ගන්ධාර්හි** (1961) බෙදී ගිය ජාතියකගේ අසරණත්වය හමුවේ ජීවිතයට මුහුණ දෙන අනසූයා අවිනිශ්චිත අනාගතයක් වැලඳ ගන්නීය. **නාගරික්** (1952) චිත්‍රපටයේ එන (රාමුගේ මව, සොහොයුරිය - සීතා, පෙම්වතිය- උමා, උමාගේ නැගණිය) ස්ත්‍රීන, සටක් නිරූපිත සරණාගත ස්ත්‍රී චරිත වේ.

සරණාගත භාවයට පත් ස්ත්‍රීන්ගේ භූමිකාව නිරූපණය කෙරෙහි විශේෂ අවධානයකින් සටක්ගේ සිනමා නිර්මාණවල ස්ත්‍රී චරිත නිරූපණය පිළිබඳ විමසා බැලීම මේ පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණ වේ.